රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2026

මගේ අංකය : MPA/PSD/AT - 2027
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2026.09.01

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2027

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026.08.25 සහ 2022.11.24 දිනැතිව සංශෝධිත, 2018.06.12 දින අනුමත කරන ලද මෙම ස්ථාන මාරු පටිපාටිය ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා ක්‍රියාත්මක කරනු ලැබේ.

### 01. වාර්ෂික ස්ථාන මාරු කමිටුව පත් කිරීම හා එහි ක්‍රියාවලිය

ස්ථාන මාරු පටිපාටියේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ 2027 වර්ෂයට අදාළව ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුව මෙම අමාත්‍යාංශය මඟින් පත් කරනු ලැබේ. මෙම කමිටුවේ කාර්යභාරය වනුයේ ස්ථාන මාරු අපේක්ෂිත නිලධරයන්ගේ ඉල්ලීම් සලකා බැලීම, නිලධරයන් වෙත සාධාරණ කාල පරාසයන් තුළ ස්ථාන මාරුවීම් ක්‍රමානුකූලව ලබා දීම සහ එකම සේවා ස්ථානයක නිලධරයන් දීර්ඝ කාලයක් තිස්සේ රැඳී සිටීම වැළැක්වීම පිණිස ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය යොදවා ගැනීම වේ.

### 02. ස්ථාන මාරුවීම් කමිටුවේ සංයුතිය

මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත නිලධරයන්ගෙන් සමන්විතව ස්ථාන මාරු කමිටුව පත් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| I. | මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) | - | සභාපති |
| II. | අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය) | - | සාමාජික |
| III. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රාදේශීය පාලන, ස්වදේශ කටයුතු අංශය) | - | සාමාජික |
| IV. | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා සංගමයේ නියෝජිතයෙක් | - | සාමාජික |

## 03. වාර්ෂික ස්ථාන මාරු කමිටු යෝජනාවලට එරෙහිව කරුණු දැක්වීමේ අවස්ථාව

ඉහත සඳහන් ස්ථාන මාරු කමිටුව මඟින් ගනු ලබන යෝජනා පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී යෝජනා සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන නිලධරයන් වෙත අවස්ථාවක් ලබා දෙනු ලබන අතර එම නිලධරයන් ලිඛිතව තම අභියාචනය මෙහි 8.3 හි සඳහන් ලිපිනයට ස්ථාන මාරු කමිටුව විසින් දන්වනු ලබන යෝජනාවල සඳහන් දිනට පෙර එවිය යුතු ය. ඉන් අනතුරුව එම කරුණු දැක්වීම් පහත සඳහන් කමිටුව මඟින් සමාලෝචනය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| I. | මෙම අමාත්‍යාංශයේ ලේකම් | - | සභාපති |
| II. | වෙනත් අමාත්‍යාංශයක ලේකම්වරයෙකු | - | සාමාජික |
| III. | අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) | - | සාමාජික |

මේ යටතේ නිලධරයන්ට ස්ථාන මාරු කිරීම්වලට එරෙහිව කරුණු ඉදිරිපත් කළ හැක්කේ පහත අවස්ථාවන්හි පමණි.

I. මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි මාරුවීම් කර ඇති අවස්ථාවල
II. නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවන අවස්ථාවල
III. නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස මාරුවීම් කරන ලද අවස්ථාවල

## 04. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා අනිවාර්යයෙන් යටත් විය හැකි නිලධරයන්

මෙම ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I/ II/ III ශ්‍රේණියේ පහත සඳහන් නිලධරයන් යටත් විය හැක.

I. එකම සේවා ස්ථානයක වසර 06 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කරන නිලධරයන්
II. එක් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ පළාත් සභාවක හෝ මුළු සේවා කාලය උපරිම වසර 12ක් සම්පූර්ණ කර ඇති නිලධරයන්
III. කොළඹ දිස්ත්‍රික්කය හැර අනෙකුත් දිස්ත්‍රික්ක අතුරින් එක් දිස්ත්‍රික්කයක් තුළ පිහිටි අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක හෝ පළාත් සභා කාර්යාලයක හෝ මුළු සේවා කාලය වසර දොළහ (12) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන්

## 05. වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ සලකා බැලිය නොහැකි ස්ථාන මාරුවීම්

මෙම ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය යටතේ ඉහත සඳහන් පරිදි කරනු ලබන ස්ථාන මාරුවීම් වලට අමතරව මෙම ක්‍රියාවලිය තුළින් ස්ථාන මාරුවීම් ලබා ගැනීමට බලාපොරොත්තු වන අනෙකුත් නිලධාරීන්ටද ඉල්ලුම් කළ හැකි ය. කෙසේ නමුදු මෙම ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා බලනුයේ ඔවුන් ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට ප්‍රථම වර්තමාන සේවා ස්ථානයේ වසර දෙකක අවම සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් පමණි. ඒ පිළිබඳ අවසන් තීරණය ස්ථාන මාරු කමිටුවේ තීරණය වන අතර එම ඉල්ලීම් පිළිබඳව ස්ථාන මාරු කමිටුව විසින් දන්වනු ලබන ස්ථාන මාරු යෝජනාවල දක්වා ඇති නියමිත දිනට පෙර කරුණු දැක්වීම් ඉදිරිපත් කළ හැකි ය.

## 06. වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන ආයතන

පහත සඳහන් ආයතනවල සේවය කරනු ලබන නිලධරයන්ගේ ස්ථාන මාරු එම ආයතනයන්ගේ ස්වභාවය සලකා මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය යටතේ සලකා බලනු නොලැබේ.

I. ජනාධිපති කාර්යාලය
II. අග්‍රාමාත්‍ය කාර්යාලය
III. ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය
IV. සභානායක කාර්යාලය
V. අමාත්‍ය මණ්ඩල කාර්යාලය
VI. විපක්ෂ නායක ලේකම් කාර්යාලය

## 07. ආයතන ප්‍රධානීන්ගේ එකඟතාවය අනුව ස්ථාන මාරුවලට යටත් වන ආයතන

පහත දැක්වෙන ආයතනවලට අදාළව වාර්ෂික ස්ථාන මාරු කමිටු මඟින් නිලධරයින් ස්ථාන මාරු කිරීමේ දී එම ආයතනවලින් පිටතට ස්ථාන මාරු කරනු ලබන හා එම ආයතනවලට ස්ථාන මාරු කරනු ලබන නිලධරයින් පිළිබඳව අදාළ ආයතන ප්‍රධානියාගේ එකඟතාවය ලබා ගැනීමට යටත්ව කටයුතු සිදු කරනු ලැබේ.

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
II. මැතිවරණ කොමිෂන් සභාව
III. මුදල් කොමිෂන් සභාව
IV. සීමා නිර්ණය කොමිෂන් සභාව
V. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ලෙස නියමයන් දක්වා ඇති ආයතන

## 08. වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාවලියට අදාළ පොදු කරුණු

8.1 මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතාවයට හා වර්තමාන සේවා ස්ථානවල සේවය කළ හැකි උපරිම සේවා කාලයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

8.2 ඉහත සඳහන් පරිදි ස්ථාන මාරු කිරීම්වලට සුදුසුකම් ලබන නිලධාරීන් මෙම ක්‍රියා පටිපාටියේ දක්වා ඇති ආකාරයට අදාළව මෙහි "ඇමුණුම I"හි දක්වා ඇති අයදුම්පත්‍ර ආකෘතියට අනුකූලව ඉල්ලුම් කළ යුතු ය.

8.3 එලෙසින් සම්පූර්ණ කරන ලද ස්ථාන මාරු අයදුම්පත්‍රය අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව නියමිත දිනට පෙර එම ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලං.ක්‍ර.සේ. වාර්ෂික ස්ථාන මාරු - 2027" යනුවෙන් සඳහන් කර පහත ලිපිනයට යොමු කළ යුතු ය.

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

8.4 මෙම චක්‍රලේඛය යටතේ සඳහන් කර ඇති ආකාරයට ස්ථාන මාරු කිරීම සඳහා අනිවාර්යයෙන් යටත් විය හැකි නිලධරයන් ඒ සඳහා ඉහත වගන්තියේ සඳහන් ආකාරයට ඉල්ලුම් නොකළද, ඔවුන් ස්ථාන මාරු කිරීමට ස්ථාන මාරු කමිටුවට බලය හිමි වේ. එසේ ඉල්ලුම් කරනු නොලබන නිලධරයන් වෙත මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය යටතේ නව සේවා ස්ථාන ලබා දීමේදී, නිසි පරිදි ඉල්ලුම් කරනු ලබන නිලධරයින් වෙත ප්‍රමුඛත්වය ලබා දීමෙන් අනතුරුව ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි ඉතිරි පුරප්පාඩු සලකා බලා ස්ථාන මාරුවීම් ලබා දෙනු ඇත. **මෙහිදී නිසි පරිදි ඉල්ලුම් කරනු ලබන නිලධරයින් ඔවුන් ඉල්ලුම් කරනු ලබන සේවා ස්ථානවල සේවය කිරීමට කැමැත්තක් දක්වන බවටත්, නිසි පරිදි ඉල්ලුම් නොකරනු ලබන නිලධරයන් දිවයිනේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමති බවටත් සලකා කටයුතු කරනු ඇත.**

8.5 වාර්ෂික ස්ථාන මාරු කමිටුව මඟින් ලබා දුන් යෝජනා සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන නිලධරයන් මෙහි "ඇමුණුම IV" හි ආකෘති පත්‍රය ප්‍රකාරව සිය කරුණු දැක්වීම ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත නියමිත කාලය තුළදී මෙහි "අංක 03" හි සඳහන් ආකාරයට ඉදිරිපත් කළ යුතු වේ.

8.6 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

I. ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය අභියාචක විසින් "ඇමුණුම V " ට අනුකූලව ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව තොරතුරු මෙහි "ඇමුණුම VI " ප්‍රකාරව මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලිවල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන අදාළ නිලධාරියා ක්‍රියා කළ යුතු වන්නේය.

II. රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ මෙම අමාත්‍යාංශයේ ලේකම් මඟින් පමණකි. අදාළ නිලධාරීන් එම අභියාචනයේ පිටපත් තම වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ යුතු වන්නේය. එලෙස යොමු කරනු ලබන අභියාචනා පිළිබඳව අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම මෙම අමාත්‍යාංශයේ

ලේකම්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකිය.

III. ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා, එම ස්ථාන මාරු කිරීමේ නියෝග අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට **දින 14 ක්** ඇතුළත මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. එලෙස නියමිත කාලය තුළදී ඉදිරිපත් නොකරන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලබන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ද ප්‍රතික්ෂේප කරනු ඇත.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපි ලේඛන හා වාර්තා ආදිය ද සමඟ ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය.

V. වාර්ෂික ස්ථාන මාරු යෝජනා ලබා දී තිබිය දී එම යෝජනාවන්ට එරෙහිව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අභියාචනා ඉදිරිපත් කර නොමැති නිලධරයින්ගේ අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු නොලැබේ.

VI. අදාළ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල සඳහන් විධිවිධාන අනුව, වාර්ෂික ස්ථාන මාරුවීමක් අයදුම් කිරීම සඳහා අවශ්‍ය අවම සේවා කාලය සම්පූර්ණ කර නොමැති නිලධරයින්ගේ අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකළ යුතු ය.

VII. මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලැබේ.

VIII. මෙහි "අංක 8.6 ( IV)" හි සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවසන් තීරණය ගනු ලැබේ.

IX. ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි මෙම අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යවනු ලැබේ.

X. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත.

**09.** අදාළ ආකෘති පත්‍රවල මෘදු පිටපත් පහත දැක්වෙන පරිදි මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

| www.pubad.gov.lk → සේවා → ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය → බාගත කිරීම් |
|---|

## 10. සේවා කාල ගණනය කිරීම

වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය. (උදා :- 2027 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2026.12.31 දිනට)

10.1 සේවා කාලය ගණනය කිරීමේදී එක් දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

කෙසේ වුවද දෙපාර්තමේන්තුවක සේවය කළ කාලය ගණන් ගැනීමේදී, නිලධරයකුගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත, සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ. (උදා - ප්‍රසූත නිවාඩු, අධ්‍යයන නිවාඩු)

10.2 කිසියම් දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළ ද එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ.

10.3 කිසියම් සේවා ස්ථානයක සේවය කරනු ලබන නිලධාරීන් නියමිත සේවා කාලය සම්පූර්ණ නොකර සිටියද, ඔවුන් වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් සේවා අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි ස්ථාන මාරුවක් ලැබීමට සුදුසු වන්නේය.

**11.** සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ඇත. නිලධරයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු නැත්නම් මිස සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 58 ක් ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම් වලට යටත් වන්නේය.

**12.** විශේෂ කොන්දේසි මත ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවාගෙන ඇති නිලධරයන්ගේ ස්ථාන මාරු මෙම පටිපාටිය යටතේ සලකා බැලිය හැක්කේ පත්වීම් ලිපිවල ඇතුළත් කොන්දේසි අනුව අදාළ කාලය ඉකුත් වීමෙන් පසු පමණි. නමුත් සේවා අවශ්‍යතාවය හෝ වෙනත් විශේෂිත හේතු මත අදාළ ප්‍රදේශ ඇතුළත ස්ථාන මාරුවීම්/අනුයුක්ත කිරීම් සිදු කිරීමට බාධාවක් නොමැත.

**13.** ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී (ඇමුණුම I පරිදි), ස්ථාන මාරු තීරණයන්ට අදාළ කරුණු දැක්වීමේදී (ඇමුණුම IV පරිදි) හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේදී (ඇමුණුම V පරිදි) සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

## 14. ස්ථාන මාරු කිරීම් පිළිබඳ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීම

14.1 වාර්ෂික ස්ථාන මාරුවලට අනිවාර්යයෙන් යටත් විය හැකි නිලධාරීන් සහ ස්ථාන මාරු ඉල්ලීම් කරන ලද නිලධාරීන් පිළිබඳ තොරතුරු අදාළ "ඇමුණුම II" පරිදි නිවැරදිව සම්පූර්ණ කර මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත මෙහි "අංක 18" හි සඳහන් වගුවේ සඳහන් නියමිත දිනට පෙර එවීම අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ/ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීම වන්නේය.

14.2 සියලුම දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවල වසර 06 කට වැඩි සහ වසර 12 කට වැඩි සේවා කාල සම්පූර්ණ කර ඇති නිලධරයන්ගේ වාර්තාවක් මෙහි අංක 10 හි 10.1 සහ 10.2 උප වගන්ති වල දැක්වෙන පරිදි දිස්ත්‍රික්ක අනුව සකස් කර එවීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අමාත්‍යාංශ ලේකම්වරුන් ඉතා වගකීමෙන් යුතුව කටයුතු කළ යුතුවේ.

14.3 නියමිත සේවා කාලය සම්පූර්ණ කිරීම හේතුවෙන් ස්ථාන මාරු කිරීමට යටත් වන එහෙත් ස්ථාන මාරු අයදුම් කර නොමැති යම් නිලධරයෙකු සිටී නම්, ඔහු / ඇය සේවා අවශ්‍යතාවය මත රඳවා ගැනීමට කිසියම් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට අවශ්‍ය නම්, වසර 06 ට වැඩි සේවා කාලය සහිත නිලධරයන්ගේ නිර්දේශ යොමු කරන අවස්ථාවේදී එවැනි නිලධරයෙකු රඳවා ගැනීමේ ඉල්ලීමද ස්ථාන මාරු අයදුම්පත් යොමු කරන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුවේ.

14.4 සෑම නිලධරයකු පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතුය. සාවද්‍ය හෝ අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළිදරව් වුවහොත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන්, එම ලැයිස්තු සකස් කළ අය හා එහි නිවැරදි බව පරීක්ෂා කර බලා තහවුරු කරන ලද නිලධරයන් ඒ පිළිබඳව වගකීමට යටත්වේ.

14.5 වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අවසන් තීරණ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේත්, වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සම්බන්ධ අවසන් තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේත්, පළ කරනු ලබන අතර ඒ අනුව ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන්ගේ ස්ථාන මාරු අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතුය.

14.6 ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයන් නියමිත දිනයේදී නව රාජකාරී ස්ථානය වෙත වාර්තා කිරීමට බැඳී සිටිති. නිලධරයෙකු වැඩ බාර ගැනීමෙන් පසු "ඇමුණුම VII" මඟින් ඒ බව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපතක් සහිතව අදාළ සේවා ස්ථානයට දැන්විය යුතුය.

14.7 ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධරයකු එම මාරුවීම ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම ස්ථාන මාරු පටිපාටියට පටහැනිය. පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා ස්ථාන මාරු නියෝග ලබන මධ්‍යම රජය යටතේ වන ආයතනයන්හි තනතුරුවල සේවයේ නියුතු ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයින්, අදාළ ස්ථාන මාරු නියෝග පරිදි නව සේවා ස්ථානවල සේවය සඳහා අනිවාර්යෙන්ම වාර්තා කළ යුතුය. එමෙන්ම, පළාත් රාජ්‍ය

සේවයේ තනතුරුවල සේවයේ නියුතු ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයින් තමා ලබන ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු වී යාමට හැකිවන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් නිදහස්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සලසා ගත යුතුය.

14.8 වාර්ෂික ස්ථාන මාරු කමිටුව මඟින් අමාත්‍යාංශයෙන්/ පළාත් සභාවලින්/ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන සේ මුදා හැරීමට කටයුතු කළ යුතුය (ඇමුණුම VIII පරිදි).

14.9 වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධරයකු නව සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 - V වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

14.10 එක් අමාත්‍යාංශයක/පළාත් සභා/දෙපාර්තමේන්තු වල ප්‍රධානින් 2027 මාර්තු 31 දිනට පෙර හෝ ස්ථාන මාරු ක්‍රියාත්මක කරනු ලබන දින සිට මසක් ඇතුළත තම ආයතනයෙන් මුදා හරින ලද/නොලද සහ සේවයට වාර්තා කළ/නොකළ නිලධාරීන් පිළිබඳ විස්තර "ඇමුණුම IX හා X" අනුව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය.

15. වාර්ෂික ස්ථාන මාරු චක්‍රයක (Cycle) ආකාරයකින් සිදු කරනු ලබන අතර ඉදිරියේදී කරනු ලබන බඳවාගැනීම් හෝ උසස්වීම්වලදී අනුප්‍රාප්තිකයන් ලබා දීම මත ස්ථාන මාරු සිදු කරනු නොලැබේ.

## 16. වාර්ෂික නොවන ස්ථාන මාරු

වාර්ෂික ස්ථාන මාරු කමිටුවල දී හැර ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ශාඛාවේ දෛනිකව සිදු කෙරෙන කාර්යයක් වශයෙන් ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ. එහෙත් පරිපාලනමය අවශ්‍යතා, සේවා අවශ්‍යතා සහ විනය හේතු මත මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් ස්ථාන මාරු නියෝග නිකුත් කෙරේ. සාමාන්‍ය රාජකාරී කටයුතු වලට බාධාවක් නොවන සුහද ස්ථාන මාරු ඉල්ලීම්ද නිලධරයන්ගේ හදිසි වූද සානුකම්පිතව සලකා බැලිය යුතු වූ කරුණු අඩංගු ඉල්ලීම්ද අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සහ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ප්‍රමාණවත් පරිදි ඉදිරිපත් කරන විට, ඒ පිළිබඳව සලකා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ.

## 17. විශේෂ රාජකාරී අවශ්‍යතා හා හදිසි සේවා අවශ්‍යතා මත ස්ථාන මාරු කිරීම

පරිපාලනමය හා සේවා අවශ්‍යතා වලදී නිලධරයකුගේ ඉල්ලීමක් නොමැතිව හා කැමැත්ත විමසීමකින් තොරව ස්ථාන මාරු කිරීමට මෙම අමාත්‍යාංශයේ ලේකම්ට හැකියාව ඇත.

## 18. ශ්‍රී ලං.ක්‍රි.සේ. නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය සිදු කිරීමේ කාලසටහන

මෙම ස්ථාන මාරු කිරීම් පහත සඳහන් වගුවේ ආකාරයට අදාළ කාල සීමාවන් තුල සිදු කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගනු ඇත.

**ස්ථාන මාරු ක්‍රියාවලියට අදාළ කාල සටහන**

| | **කාර්යය** | **දිනය** |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව නාමිකව පිහිටු වීම.* | 2026 අගෝස්තු මස 01 දිනට පෙර |
| 02 | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම. | 2026 සැප්තැම්බර් මස 15 වන දිනට පෙර |
| 03 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා** වෙත ඉදිරිපත් කිරීම. | 2026 ඔක්තෝබර් මස 15 වන දිනට පෙර |
| 04 | අදාළ බලධාරියා** විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම. | 2026 ඔක්තෝබර් මස 25 වන දිනට පෙර |
| 05 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා** වෙත ලිඛිතව භාර දීම. | 2026 නොවැම්බර් මස 15 වන දිනට පෙර |
| 06 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව නාමිකව පත් කිරීම. | 2026 නොවැම්බර් මස 30 වන දිනට පෙර |
| 07 | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | 2026 දෙසැම්බර් මස 15 වන දිනට පෙර |
| 08 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා** වෙත ලිඛිතව භාර දීම. | 2026 දෙසැම්බර් මස 31 වන දිනට පෙර |
| 09 | අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම. | 2027 ජනවාරි මස 15 වන දිනට පෙර |
| 10 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම. | 2027 ජනවාරි මස 31 වන දිනට පෙර |
| 11 | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම. | 2027 මාර්තු මස 01 වන දින හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියෝග කරනු ලබන දිනක සිට |
| 12 | සේවා ස්ථානවලට මුදාහරින ලද, තම සේවා ස්ථානයට වාර්තා කරන ලද නිලධරයින් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීම. | 2027 මාර්තු මස 31 වන දිනට පෙර හෝ ස්ථාන මාරු ක්‍රියාත්මක කරනු ලබන දින සිට මසක් ඇතුළත |

*සටහන*

**** ඉහත අංක 1 හි දැක්වෙන කමිටුව මෙම චක්‍රලේඛයේ 02 ඡේදයේ සඳහන් පරිදි නියමිත දින පිහිටුවා ඇත***

***** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්***

**19. වෙනත් කරුණු**

**19.1 වාර්ෂික ස්ථාන මාරුවීම් පටිපාටියට පරිබාහිර අවස්ථා:**

මෙම ස්ථාන මාරුවීම් පටිපාටියට පරිබාහිරව කරන ස්ථාන මාරු ඉල්ලීම් අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ /පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ පෞද්ගලික නිර්දේශ සහිතව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමට හේතු වූ කරුණු පිළිබඳව සෑහීමකට පත් වන්නේ නම් එම ඉල්ලීම සලකා බලා සුදුසු තීරණයක් ගනු ඇත.

**19.2 එකම අමාත්‍යාංශයක් තුළ දෙපාර්තමේන්තු අතර මාරු කිරීම**

අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු අතර I ශ්‍රේණියේ නිලධරයින් හැර අනෙකුත් නිලධරයින් ස්ථානගත කිරීම් සිදු කිරීමේ බලතල අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට ඇත. එසේ සිදු කළ විටක ඒ බව මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා එවිය යුතු ය.

**19.3 එකම දෙපාර්තමේන්තුවක් තුළ ස්ථාන මාරු කිරීම**

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ස්ථාන මාරු කිරීම් පිළිබඳ යෝජනා අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර එම ඉල්ලීම අනුව ස්ථාන මාරු කිරීමක් සිදු කළ විට අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඒ බව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා එවිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112 688124
ෆැක්ස් : 0112 691690
විද්‍යුත් ලිපිනය : d.psd.pubad@gmail.com

ඇමුණුම I

**ස්ථාන මාරු අයදුම්පත - වර්ෂය 2027**

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I, II සහ III ශ්‍රේණිවල නිලධාරීන් සඳහා**

1. පෞද්ගලික තොරතුරු

1.1. නම (පත්වීම් ලිපියේ පරිදි) : ..........................................................................................

1.2. නම වෙනස් කර ඇත්නම් එම නම මුලකුරු සමඟ : ..........................................................

1.3. සම්පූර්ණ නම : ..............................................................................................................

1.4. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

1.5. මුල් පත්වීම් දිනය : ........................................................................................................

1.6. පෞද්ගලික ලිපිනය : ......................................................................................................

..............................................................................................................................................

1.7. දුරකථන අංකය : නිවස ............................................ ජංගම : ..........................................

2. වර්තමාන සේවා ස්ථානය

2.1. අමාත්‍යාංශය/පළාත් සභාව : ..........................................................................................

2.2. දෙපාර්තමේන්තුව/ පළාත් අමාත්‍යාංශය : ......................................................................

2.3. කාර්යාලයීය ලිපිනය : ....................................................................................................

2.4. කාර්යාලයීය දුරකථන අංකය : .......................................................................................

3. තනතුර

3.1. වර්තමාන තනතුරු නාමය : ..............................................................................................

3.2. එම තනතුරට පත්වූ දිනය : ..............................................................................................

4. ස්ථාන මාරු ඉල්ලීමට හේතුව : ..............................................................................................

..............................................................................................................................................

5. පූර්ව සේවා ස්ථාන :

| තනතුර | සේවා ස්ථානය | | කාලසීමාව |
|---|---|---|---|
| | ආයතනය | ආයතනය අයත් වන දිස්ත්‍රික්කය | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථාන :

| **තනතුර** | **සේවා ස්ථානය** |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවට සහතික කරමි. මා විසින් ස්ථාන මාරු ලැබීමට ඉල්ලා ඇති ඕනෑම සේවා ස්ථානයකට /එම ස්ථානවලට ඉතා ආසන්න ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමැත්ත මින් පළ කරන බවත් එම ඉල්ලීම මත, ලබා දෙන ස්ථාන මාරුව සඳහා නියෝග නිකුත් කළ පසු එම නියෝගය අවලංගු කිරීමට හිමිකමක් නොමැති බවත් පිළිගනිමි.

දිනය : ........................................ ............................................

අත්සන

ඇමුණුම II

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ ස්ථාන මාරුවීම් අයදුම්පත් උපලේඛනය - 2027 වර්ෂය**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව : ................................................................................................

ප්‍රාදේශීය කාර්යාලය/දිස්ත්‍රික්කය : ................................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය | පත්වීම් දිනය හා මාධ්‍යය | තනතුර/ ශ්‍රේණිය | පෞද්ගලික ලිපිනය | උපන්දිනය හා 2026.12.31 දිනට වයස | විවාහක/අවිවාහක බව - කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසල් යන දරුවන් සංඛ්‍යාව | පූර්ව සේවා ස්ථාන හා කාලසීමාව | මාරුවීම් ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථානය | මාරු කමිටුවේ තීරණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

සියලුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ නම : ........................................ අත්සන : ............................................

පරීක්ෂා කළේ නම : ........................................ අත්සන : ............................................

දිනය : ..................................... ....................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගත හැකි නිලධාරියකුගේ

නම හා තනතුර : ........................................................................

දුරකථන අංකය : ........................................................................

**එක් දිස්ත්‍රික්කයක, එක් සේවා ස්ථානයක අවුරුදු 06 කට වැඩි කාලයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ ඕනෑම සේවා ස්ථානයක අවුරුදු 12 කට වැඩි කාලයක් සේවය කර ඇති සියලුම නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව සලකන්න. (2026.12.31 දිනට)**

**(වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සලකන්න.)**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව :........................................................................................................................................................

ප්‍රාදේශීය කාර්යාලය/දිස්ත්‍රික්කය : .........................................................................................................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම (මයා/මිය/මෙය යන්න සඳහන් කරන්න) | පත්වීම් දිනය | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර/ ශ්‍රේණිය හා මාධ්‍යය | උපන්දිනය හා 2026.12.31. දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2026.12.31 දිනට | විවාහක/ අවිවාහක බව - කලත්‍රයාගේ සේවා ස්ථානය | පාසල් යන ළමයින් පිළිබඳ විස්තර | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාලසීමාවන් | වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම්කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුණහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03 ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

සියලුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ නම : ....................................... අත්සන : .....................................................

පරීක්ෂා කළේ නම : ......................................... අත්සන : .....................................................

දිනය : ...................................

.............................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගත හැකි නිලධාරියකුගේ

නම හා තනතුර : ........................................................................

දුරකථන අංකය : .........................................................................

ඇමුණුම **IV**

**<u>ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ ස්ථාන මාරුවීම් - අභියාචනා පිළිබඳ ඉල්ලුම් පත්‍රය - වර්ෂය 2027</u>**

අමාත්‍යාංශය :................................................
දෙපාර්තමේන්තුව : ...........................................

| ස්ථානමාරුවීම් ලේඛනයේ අනන්‍යතා අංකය : ............................................. |
|---|

(අ) නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

1. I. නිලධාරියාගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්): ........................................................................................................................................ මයා/මිය/මෙනවිය
   II. ස්ථිර ලිපිනය: ............................................................................................................................
   III. පදිංචි ස්ථානයේ ලිපිනය: ............................................................................................................................
   IV.2027 වර්ෂයේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් නව පදිංචි ස්ථානයේ ලිපිනය : ............................................................................................................................
2. ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය : ...........................................................................
3. තනතුර හා ශ්‍රේණිය : ...........................................................................
   3.1. සේවයට ඇතුළත් වූ දිනය : ...........................................................................
   3.2. ශ්‍රේණියට ඇතුළත් වූ දිනය : ...........................................................................
4. උපන් දිනය : ...........................................................................
   2026.12.31 දිනට වයස අවු. : ...........................................................................
5. සේවා විස්තර

| සේවා විස්තර | පත් වූ දිනය | සේවා ස්ථානය සිට / දක්වා |
|---|---|---|
| ................................ | .................................... | ............................................. |
| ................................ | .................................... | ............................................. |
| ................................ | .................................... | ............................................. |

6. මා ඉල්ලා සිටිනුයේ දී ඇති ස්ථාන මාරුවීම අවලංගු කිරීමටය / සංශෝධනය කිරීමටය.
7. අභියාචනා කිරීමට හේතු (පසු පිටෙහි සඳහන් කරන්න)
8. ස්ථාන මාරුව සංශෝධනය කළ යුතු/ලබාදිය යුතු සේවා ස්ථානය :
   අමාත්‍යාංශය : ...........................................................................
   දෙපාර්තමේන්තුව : ...........................................................................

දිනය : ....................................

..................................
නිලධාරියාගේ අත්සන

(ආ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ :

I. කාර්යාල තොරතුරු අනුව ඉහත විස්තර නිවැරදි වේ.
II. මෙම ස්ථාන මාරුව අවලංගු කිරීම/ සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන කරුණු දැක්වීම හා නිර්දේශය:............................................................................................................................

දිනය : ...............................

.........................................................................................
අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(අනවශ්‍ය වචන කපා හරින්න. සම්පූර්ණ තොරතුරු ඇතුළත් නොකළ අයදුම්පත් අභියාචනා මණ්ඩලය විසින් සළකා බලනු නොලැබේ. වැඩි විස්තර ඇත්නම් පසුපිට සඳහන් කරන්න)

ඇමුණුම **V**

**<u>වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා</u>**

**<u>ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - වර්ෂය 2027</u>**

**<u>අභියාචක පිළිබඳ තොරතුරු</u>**

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමඟ නම | | | |
| 02. තනතුරු හා ශ්‍රේණිය | | | |
| 03. උපන් දිනය<br>YYYY/MM/DD | 04. වයස :-<br>(2026.12.31 දිනට) | 05. ජාතික හැඳුනුම්පත් අංකය :- | 06. ස්ත්‍රී / පුරුෂ භාවය :- |
| 07. ස්ථිර ලිපිනය :-<br><br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-<br><br>දිස්ත්‍රික්කය :- | | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය<br><br>කාර්යාලය :-<br><br>පෞද්ගලික :- |
| 10. විවාහක / අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- | |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසැල් :- | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය :- | |
| 17. වර්තමාන සේවා ස්ථානය | 18. සේවා ස්ථානය පිහිටි නගරය :- |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :- | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය<br>(2026.12.31 දිනට)<br><br>අවුරුදු............මාස............දින......... |

| 21. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | | සේවා කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | 1 | | | |
| | 2 | | | |
| | 3 | | | |
| | 4 | | | |
| | 5 | | | |
| | 6 | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

| 22. වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | | ස්ථාන මාරු අයදුම් කර ඇති සේවා ස්ථාන | |
|---|---|---|---|
| ඇත | නැත | 1 | |
| | | 2 | |
| | | 3 | |
| | | 4 | |
| | | 5 | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය :- | | | |
| ස්ථාන මාරු ලැබී ඇති සේවා ස්ථානයට , නිලධාරියා ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඇති දුර (කි.මී) :-<br><br>ස්ථානමාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් ගණන : - | | | |

| 23. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
|---|---|---|
| | නැත | |

24. නිලධරයා මීට පෙර වර්ෂවලදී වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කර තිබේද?

ස්ථාන මාරු ඉල්ලුම් කර ඇත්නම්, ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති වර්ෂ හා ඉල්ලුම් කර ඇති සේවා ස්ථාන

| | ඉල්ලුම් කළ වර්ෂය | ඉල්ලුම් කරන ලද සේවා ස්ථාන |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

| |
|---|
| 25. ඉහත අංක 23 පරිදි ඉල්ලුම් කරන ලද වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් සම්බන්ධයෙන් ලැබී ඇති තීරණ :-<br>(ස්ථාන මාරුවක් ලැබී නොමැති නම් ඒ බවද සඳහන් කරන්න) |

ඇ. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම් පිළිබඳ තොරතුරු :-

| 26. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම :- | | | |
|---|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන | |
| ස්ථාන මාරුව සංශෝධනය කිරීම | | 1 | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | 2 | |
| | | 3 | |

| |
|---|
| 27. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :- |

ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය පිළිබඳ තොරතුරු :-

| |
|---|
| 28. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු :-<br>1. ..........<br>2. ..........<br>3. .......... |

| |
|---|
| 29. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත. :-<br>ඇමුණුම 1 ..........<br>ඇමුණුම 2 ..........<br>ඇමුණුම 3.......... |

| |
|---|
| 30. ඉල්ලා සිටිනු ලබන සහන :-<br>1. ..........<br>2. ..........<br>3. .......... |

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

................................ දිනය

.................................. අත්සන

ඊ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ

නිලධාරියා / නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවරදි බව සහතික කරමි. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 2027 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

I. ..........................................................................................................................................

II. ..........................................................................................................................................

III. ..........................................................................................................................................

.................................. ..................................
දිනය අත්සන

උ. ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශ :-

I. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන ..........................................................................

II. අභියාචනය පිළිබඳ නිර්දේශය :

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

.................................. ..................................
දිනය අත්සන

ඇමුණුම VI

**වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා**

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - වර්ෂය 2027**

**අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු**

I. අභියාචක නිලධාරියාගේ නම හා තනතුර :
.....................................................................................................................................................

II. අභියාචක නිලධරයාට අදාළ අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමඟ නම | | | |
| 02. තනතුරු හා ශ්‍රේණිය | | | |
| 03. උපන් දිනය<br>YYYY/MM/DD | 04. වයස :-<br>(2026.12.31 දිනට) | 05. ජාතික හැඳුනුම්පත් අංකය :- | 06. ස්ත්‍රී / පුරුෂ භාවය :- |

| | | |
|---|---|---|
| 07. ස්ථිර ලිපිනය :- | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- |
| 10. විවාහක / අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසැල් :- |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය :- | |
| 17. වර්තමාන සේවා ස්ථානය :- | 18. සේවා ස්ථානය පිහිටි නගරය :- |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :- | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය<br>(2026.12.31 දිනට)<br>අවුරුදු............මාස............දින |

| 21. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | | සේවා කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | 1 | | | |
| | 2 | | | |
| | 3 | | | |
| | 4 | | | |
| | 5 | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

| 22. වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | | ස්ථාන මාරු සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් ඉල්ලුම් කළ සේවා ස්ථාන | |
|---|---|---|---|
| ඇත | නැත | 1 | |
| | | 2 | |
| | | 3 | |
| | | 4 | |
| | | 5 | |

ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය :-

ස්ථාන මාරු ලැබී ඇති සේවා ස්ථානයට, නිලධරයා පදිංචි ස්ථානයේ සිට ඇති දුර (කි.මී.) :-

ස්ථාන මාරු චක්‍රය සමන්විත නිලධාරීන් ගණන :- ...................................

23. නිලධරයා මීට පෙර වර්ෂවලදී වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කර තිබේද?

ස්ථාන මාරු ඉල්ලුම් කර ඇත්නම්, ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති වර්ෂ හා ඉල්ලුම් කර ඇති සේවා ස්ථාන

| | ඉල්ලුම් කළ වර්ෂය | ඉල්ලුම් කරන ලද සේවා ස්ථාන |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

| |
|---|
| 24. ඉහත අංක 22 පරිදි ඉල්ලුම් කරන ලද වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ලැබී ඇති තීරණ :- |

ඈ. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම් පිළිබඳ තොරතුරු : -

| | | |
|---|---|---|
| 25. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

| | | |
|---|---|---|
| 26. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම:- | | |
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ කළ සේවා ස්ථාන |
| සංශෝධනය කිරීම | | 1 |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | 2 |
| | | 3 |

| |
|---|
| 27. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :- |

ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීම පිළිබඳ තොරතුරු: -

| |
|---|
| 28. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබේ ද / නැද්ද යන්න :- |

29. අභියාචකගේ ඉල්ලීම ඉටු කළහොත් අනුප්‍රාප්තික නිලධරයාට අගතියක් නොවන පරිදි ස්ථාන මාරු චක්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිර්දේශය :-

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

................................ ................................

දිනය අත්සන

ඇමුණුම **VII**

| | |
|---|---|
| නම | : ………………………………......... |
| සේවා ස්ථානය | : ……………………………............. |
| දිනය | : ………………………………......... |

…………………………………….. මඟින්,

…………………………………….. මඟින්,

ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

<u>**නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීම**</u>

………… (වසර) වසරේ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව…………………. (මුදා හරින ලද දිනය) දින සිට සේවයෙන් මුදා හරින ලද මා……………………. (සේවය වාර්තා කළ දිනය) දින………………………………………………… (සේවා ස්ථානය) සේවයට වාර්තා කළ බව කාරුණිකව දන්වමි.

මෙයට විශ්වාසී,

අත්සන :- ………………………

සේවය :- …………………….......

ශ්‍රේණිය :- ……………...............

ජාතික හැඳුනුම්පත් අංකය :- ............................

සේවක අංකය :- ……………………......

සේවයට වාර්තා කළ බව තහවුරු කරමි.

………………………

දිනය

………..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

පිටපත් :

i. **ලේකම්,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ඇමුණුම **VIII**

මගේ අංකය :- .......................................................

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව :- .......................................................

දිනය :- .......................................................

..................................................... මගින්,

..................................................... මගින්,

.............................................................................. මහතා/ මිය/ මෙය,

තනතුර:- ....................................................

<u>**වාර්ෂික ස්ථාන මාරු ලැබීම මත සේවයෙන් මුදා හැරීම**</u>

………… (වසර) වසරේ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ඉහත නම් සඳහන් නිලධාරියා/ නිලධාරිණිය ……………………. (නව සේවා ස්ථානය) වෙත සේවයට වාර්තා කළ හැකි වන පරිදි ………………………………………………… (මුදා හරිනු ලබන දිනය) දින සිට සේවයෙන් මුදා හරින බව කාරුණිකව දන්වමි.

…………………………………..................

ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

පිටපත්:

**i.** **ලේකම්**, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ඇමුණුම IX**

**<u>……………………………………………. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව</u>**

**<u>වෙත ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්</u>**

සේවය:- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය

| නම | සේවක අංකය | ශ්‍රේණිය | පෙර සේවා ස්ථානයෙන් මුදා හරින ලද දිනය | නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ දිනය | ඇමුණුම අංක VII රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා තිබේද |
|---|---|---|---|---|---|
| | | | | | |

ඇමුණුම **X**

**<u>................................................ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ කාර්යාලය/ පළාත් සභාව</u>**

**<u>වෙතින් ස්ථාන මාරු වී ගිය නිලධාරීන්</u>**

සේවය:- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය

| නම | සේවක අංකය | ශ්‍රේණිය | මුදා හරින ලද දිනය | ඇමුණුම අංක VII රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා තිබේද |
|---|---|---|---|---|
| | | | | |